# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2343/26 - 2023 අගෝස්තු මස 02 වැනි බදාදා - 2023.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව

9 වන සංශෝධනය

පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත, 2014 සැප්තැම්බර් 19 දිනැති අංක 1880/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මෙහි පහත II කොටසේ දැක්වෙන පරිදි නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**තනූජා මුරුගේෂන්,**
*වැඩ බලන ලේකම්,*
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2023 ජූලි මස 28 වැනි දින,

I කොටස

සංශෝධන අංක 01 - 2016 ජුනි මස 15 වැනි දින හා අංක 1971/17 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2017 අගෝස්තු මස 17 වැනි දින හා අංක 2032/33 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2019 ඔක්තෝබර් මස 22 වැනි දින හා අංක 2146/22 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - 2020 පෙබරවාරි මස 10 වැනි දින හා අංක 2162/10 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 05 - 2020 මාර්තු මස 03 වැනි දින හා අංක 2165/14 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 06 - 2021 ජුනි මස 29 වැනි දින හා අංක 2234/12 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 07 - 2022 ජනවාරි මස 26 වැනි දින හා අංක 2264/11 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 08 - 2022 අප්‍රේල් මස 29 වැනි දින හා අංක 2277/58 *අති විශෙෂ ගැසට් පත්‍රය*

1A - G 40021 — 07 (2023/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

*7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්*

*7.2.2.1.1 කෘෂි සංවර්ධන ධාරාව සහ කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

*7.2.2.1.2 කෘෂි පර්යේෂණ ධාරාව සඳහා*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා තිබීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උද්භිත විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

EOG - 08-0018

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.